අ.පො.ස. උසස් පෙළ

# නාට්‍ය හා රංගකලාව I

Channel NIE

**අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා වූ පෙරහුරු පරීක්ෂණය**

**නාට්‍ය හා රංගකලාව I** **පෙරදිග** **කාලයඃ පැය තුනයි**

උපදෙස්ඃ

විභාග අංකය :....................................

- **I කොටස** - **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- **II කොටස** - **A** හා **B** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

**I කොටස**



1. දකුණු පස දැක්වෙන ඡායාරූපය අයත් නාට්‍යයේ ශෛලියට අදාළ වර්ගයේ නාට්‍ය වඩාත් ම අන්තර්ගත වී ඇති පිළිතුර තෝරන්න.

   1. මගුල් ප්‍රස්ථාව, අභිඥාන ශාකුන්තලය,ජූලියස් සීසර්,කැලණි පාලම
   2. වෙරි වත්ත, නාගානන්දය, අභිඥාන ශාකුන්තලය,ජූලියස් සීසර්
   3. ඇන්ටිගනි, කැලණි පාලම, බෙරහඬ, තල මල පිපිලා, ඊඩිපස්
   4. ඇන්ටිගනි, ජූලියස් සීසර්, බෙරහඬ, තල මල පිපිලා, ඊඩිපස්
   5. නාගානන්දය, අභිඥාන ශාකුන්තලය,ජූලියස් සීසර්, බෙරහඬ

- පහත දැක්වෙන ලෝක ධර්මී හා නාට්‍ය ධර්මී ශෛලීන් පිළිබඳ ප්‍රකාශ අනුව ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

   1. පාත්‍රයන් ස්වභාවිකව හැසිරේ.
   2. බොහෝ දේ මූර්තිමත් ලෙස ඉදිරිපත් කෙරේ.
   3. ස්වර හා අලංකාර සහිත ය.
   4. වේදිකා සැරසිලිවලින් තොර වේ.
   5. ලාලිත්‍යයෙන් යුතු අංග චලනයෙන් තොර ය.
   6. සංවාද ව්‍යවහාර බසට සමානය.

2. ‘කැලණි පාලම’ නාට්‍ය අයත් ශෛලිය ට අදාළ ප්‍රකාශ සඳහන් වරණය කුමක් ද?

   1. 2,3,6
   2. 2,3,5
   3. 1,5,6
   4. 3,4,6
   5. 1,4,5

3. ලෝමහංස නාට්‍ය අයත් ශෛලිය ට අදාල ප්‍රකාශ සඳහන් වරනය කුමක්ද?

1. 2,4,6
2. 2,3,4
3. 4,5,6
4. 1,2,6
5. 4,5,6

පහත වදන් ගොනුව ඇසුරින් 4 සිට 8 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A. ජේසාලෙයි
B. කටු ඔටුන්න
C. ලෝකාරම්භය
D. සුරුවම
E. ලෙස්ලි
F. අන්තිම රාත්‍රී භෝජනය
G. නූල් සූත්තර
H. ක්ලෙමන්ට්
I. ගොල්ගොතා
J. යාපනය
K. මීගමුව
L. ලෝරන්ස්
M. ජීව රූප
N. උත්ථාන වීම
O මලවුන් නැගිටියි

4. 1728 පසුව පාස්කු නාට්‍ය පෙන්වීම ආරම්භ කළ ස්ථාන ……….. වේ.
5. පාස්කු ඇසුරින් නිර්මාණය වූ වේදිකා නාට්‍යයන් …….. ය.
6. දුවේ පාස්කු දුක් ප්‍රාප්ති නාට්‍යයේ රඟපාන නාට්‍ය අවස්ථා …….. වේ.
7. පාස්කු නාට්‍ය නිර්මාණකරණයට දායක වූවෝ ………. ය.
8. පාස්කු නාට්‍ය රඟදැක්වීමේ දී භාවිත කළ රංගෝපක්‍රම................. වේ.

9. පැදුරු උපත සම්බන්ධ කවි ගායනා ඇති අන්තර් රංග අවස්ථාව ඇත්තේ,

1. දොළහ පෙළපාලිය
2. කපුයක්කාරිය
3. ගුරුගේ මාලාව
4. රාම මැරීම
5. ඇත් බන්ධනය

ප්‍රශ්න අංක 10 සිට14 දක්වා ප්‍රශ්න වලට පහත තොරතුරු ඇසුරෙන් පිළිතුරු සපයන්න.

A. කඩවත් තරණයක් දැකගත හැකි ය.
B. ගෑස් ලාම්පු මුල්වරට ආලෝකය සපයා ගැනීමට යොදා ගැනුණි.
C. පස් ගොඩ ගසා සකස් කරගෙන ඇත.
D. වෙස්මුහුණු පැළඳීම ප්‍රධාන වේ.

E. වෙස් ඇඳුම් කට්ටලයෙන් අඩක් පළඳියි.

F. ස්ත්‍රීන් මුල්වරට රංගාවතරණය වේ.

G. උරුට්ටුව නම් කොටස සහිත ය.

H. පත්තිනි ඇදහිල්ලක් ලෙස ද සැලකේ.

I. පහතරට නර්තන අවස්ථාවලින් පොහොසත් ය.

J. බම්මන්නා ගේ චරිතය දක්නට ලැබේ.

K. කතෝලික ආභාසය ඇති කතා පුවත්වලින් යුක්ත ය.

10. නාඩගම් නාට්‍ය කලාවට අදාළ වගන්ති වනුයේ

1. A,B,C  2. D,E,F  3. G,H,I
4. J,K,A  5. C,G,K

11. නූර්ති නාට්‍ය කලාවේ ලක්ෂණ වේ.

1. B,F,J  3. C,E,K  5. J,C,B
2. F,G,J  4. A,H,I

12. කෝලම් ගැමි නාටකයේ ලක්ෂණයන් ය.

1. A,C  3. K,J  5. F,G
2. D,I  4. D,E

13. A,E,H අක්ෂරවලින් කියවෙන ලක්ෂණ අයත් නාට්‍ය විශේෂය වන්නේ.

1. නූර්ති  3. කෝලම්  5. ශාන්තිකර්ම
2. නාඩගම්  4. සොකරි

14. C හා D අක්ෂර වලින් දැක්වෙන්නේ නාට්‍ය සම්ප්‍රදායන් දෙකකට අදාළ ලක්ෂණයන් ය. එම ලක්ෂණ අයත් නාට්‍ය සම්ප්‍රදායයන් දෙකට පොදු ලක්ෂණයක් වන්නේ.

1. උඩරට ප්‍රදේශයේ පැවැත්වීම
2. විධිමත් නාට්‍ය පිටපත් රචකයන් සිටීම
3. අර්ධ කවාකාර රංග භූමියක රඟ දැක්වීම
4. මංගලම් ගීයකින් ඉදිරිපත් කිරීම අවසන් වීම
5. පූර්ව රංගය හා අපර රංගය ලෙස බෙදා තිබීම

15. නූතනයේ ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි නාට්‍ය ප්‍රවර්ධනයෙහිලා සුවිශේෂී ව ක්‍රියාකරන්නෝ වන්නේ,

1. ඉන්දු ධර්මසේන, හේග් කරුණාරත්න, දීපානි සිල්වා
2. ජෙරොම් ද සිල්වා, අර්නස්ට් මැකින්ටයර්, රුවන්ති ඩිකේරා
3. ජයන්ත චන්ද්‍රසිරි, පරාක්‍රම නිරිඇල්ල, ජෙරොම් ද සිල්වා
4. ජෙරොම් ද සිල්වා, ඉන්දු ධර්මසේන, රුවන්ති ඩිකේරා
5. අර්නස්ට් මැකින්ටයර්, ඉන්දු ධර්මසේන, ජෙරොම් ද සිල්වා

16. ස්වතන්ත්‍ර වේදිකා නාට්‍ය පමණක් රචනා කොට ඇති සිංහල නාට්‍යකරු වන්නේ

1. ධර්මසිරි බණ්ඩාරනායක
2. රංජිත් ධර්මකීර්ති
3. කේ බී හේරත්
4. බන්දුල විතානගේ
5. සුගතපාල ද සිල්වා

17. සංස්කෘත නාටකයෙහි නායක චරිතය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1. අභිඥාන ශාකුන්තලයෙහි දුශ්‍යාන්ත රජ ධීරෝදාත්ත නායකයෙකි
2. සංස්කෘත නාට්‍යයෙහි දේව චරිත අයත් වන්නේ ධීර ලලිත වර්ගයට ය.
3. රත්නාවලී නාටිකාවේ උදයන රජු ධීර ප්‍රශාන්ත නායකයෙකි.
4. අභිඥාන ශාකුන්තලයෙහි දුශ්‍යන්ත රජ ධීරෝද්ධත නායකයෙකි.
5. සංස්කෘත නාට්‍යයෙහි නායක චරිත වර්ග තුනකි.

* නිවැරදි පිළිතුර තෝරන්න.

18. නෝ නාට්‍යයක " හ" යනුවෙන් හැඳින්වෙන්නේ.

1. නාට්‍යමය ක්‍රියාවේ විකාශන අවස්ථාව යි.
2. නළුවා වෙස්මුහුණු පැළඳවීම යි.
3. වේදිකාව මත නළුවා සුසුම් හෙලීමයි.
4. නාට්‍ය නැරඹීමෙන් ප්‍රේක්ෂකයා උකහා ගන්නා රසය යි.
5. නෝ වේදිකාවේ ස්ථාවර සැරසිල්ල යි.

19. සංස්කෘත නාට්‍යවල **ප්‍රාප්ත්‍යාශා** අවස්ථාව යනු,

1. නාට්‍යමය ගැටුම නිරාවරණය කිරීමයි
2. නාට්‍යයේ අර්බුදකාරී අවස්ථාව නිරූපණය කිරීමයි
3. පෙම්වතුන් කලහ කිරීමයි
4. නාට්‍යයේ ප්‍රස්තාවනාවයි
5. නාට්‍යයේ අවසානයයි

20. සංස්කෘත නාට්‍යවල උප කතා වස්තුව හැඳින්වෙන්නේ මේ නමින් ය,

1. ප්‍රාසාංගික
2. ආධිකාරික
3. ප්‍රස්තාවනාව
4. විශ්කම්භක
5. නාන්දිය

21. ජෝන් ද සිල්වා ශූරීන්ගේ නූර්ති නාට්‍ය කාණ්ඩ පහකට වර්ග වේ. ඔහුගේ “පරාභව” නාට්‍ය අයත් වන කාණ්ඩයේ නම කුමක් ද?

1. ලංකා ඉතිහාසය පදනම් කර ගත් නාට්‍ය
2. කාලීන සමාජ අත්දැකීම් පදනම් කරගත් නාට්‍ය
3. ඉංග්‍රීසි නාට්‍යවල අනුවාද පදනම් කරගත් නාට්‍ය
4. සාම්ප්‍රදායික බෞද්ධ කතා වස්තු ඇසුරු කරගත් නාට්‍ය
5. සංස්කෘත සාහිත්‍ය ඇසුරු කරගත් නාට්‍ය

22. ටවර් හෝල් යුගයේ කීර්තිමත් ම නාට්‍යකරුවා ලෙස හැඳින්වේ

1. චාල්ස් ඩයස්
2. ජෝන් ද සිල්වා
3. පීටර් සිල්වා
4. සී දොන් බස්තියන්
5. මැන්දිස් පෙරේරා

- අංක 24 සිට 28 දක්වා ප්‍රශ්නවලට පහත තොරතුරු ආධාරයෙන් පිළිතුරු සපයන්න.

A. බහින කලාව
B. ද ට්වින්ස්
C. තුරුම්පු කොළය
D. මුදලාලිගේ පෙරළිය
E. රත්තරන්
F. වෙදහටන
G. දුටු ගැමුණු
H. වෙයාර් විමෙන් රූල් (Where women rule)

23. එදිරිවීර සරච්චන්ද්‍රගේ මුල් ම ස්වතන්ත්‍ර නාට්‍ය ලෙස සැලකෙන්නේ මින් කුමන නාට්‍යයක් ද?

1. A
2. C
3. D
4. E

24. B අක්ෂරයෙන් දැක්වෙන නාට්‍යයේ මුල් රචකයා කවුද?

1. ටෙරන්ස්
2. ඇරිස්ටොෆනිස්
3. මිනැන්ඩර්
4. ප්ලෝටස්
5. සොෆොක්ලීස්

25. ඉහත සඳහන් නාට්‍ය අතරින් ගුවන්විදුලිය නාට්‍යයක් ලෙස නිර්මාණය වූ නාට්‍ය කුමක් ද?

1. D
2. E
3. F
4. G
5. H

26. 1921 ආරම්භ වූ විශ්වවිද්‍යාල කොලීජියේ ඉංග්‍රීසි නාට්‍ය සංගමය මගින් නිර්මාණය කළ මුල්ම නාට්‍ය,

1. D
2. E
3. F
4. G
5. H

27. ප්‍රංශ ජාතික නාට්‍යකරු මොලියර්ගේ නාට්‍යයක අනුවර්තනයකි,

1. A
2. B
3. C
4. D
5. E

- විවිධ කලා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
  1. රසිකයාගේ විඥානය පුළුල් කරමින්, වඩා ගැඹුරු අධ්‍යාත්මික ශික්ෂණයක් අපේක්ෂිත කලාව
  2. භාව ප්‍රකාශනයෙන් තොර මිනිස් ක්‍රියාකාරකම්
  3. අභිචාරමය අරුතින් කරන ලද නැටුම්, ගැයුම්, වැයුම්
  4. ස්වභාවික ලෝකයේ මතුපිට ලක්ෂණ කලා මාධ්‍යවල නොගැඹුරු ස්වරූප ඇසුරින් අනුකරණය කරන කලාව

28. ඉහත සඳහන් කරුණු හතර පිළිවෙලින් අදාළවන පිළිතුර සහිත වරණය තෝරන්න.

1. ප්‍රාකෘතික කලා, ශිල්ප කලා, ජනප්‍රිය කලා, ලලිත කලා
2. ලලිත කලා, ශිල්ප කලා, ප්‍රාකෘතික කලා, ජනප්‍රිය කලා
3. ලලිත කලා, ප්‍රාකෘතික කලා, ශිල්ප කලා, ජනප්‍රිය කලා
4. ජනප්‍රිය කලා, ලලිත කලා, ප්‍රාකෘතික කලා, ශිල්ප කලා
5. ජනප්‍රිය කලා, ප්‍රාකෘතික කලා, ලලිත කලා, ශිල්ප කලා

29. “කෙනෙකු ගල් මුගුරු ගහලා මරා දමන එක වැදගත් සිද්ධියක් ද?”

කුවේණි නාට්‍යයේ මෙසේ පවසන්නේ කවුද?

1. දඩයක්කරු
2. I නීතිඥයා
3. ජීවහත්ත
4. දිසාලා
5. II නීතිඥයා

30. කුවේණි කතා පුවත අන්තර්ගත නොවූ ඓතිහාසික මූලාශ්‍රයක් වන්නේ,

1. රාජාවලිය
2. දීපවංශය
3. මහාවංශය
4. වංසත්ථප්පකාසිනිය
5. පන්සිය පනස් ජාතක පොත

31. “ මම තුවක්කුව විසිකළා ගඟකට” දඩයක්කරුගේ මෙම ප්‍රකාශයේ ව්‍යංගාර්ථය කුමක්ද?

1. ඔහු දඩයම සඳහටම අත්හළ බව
2. ඉතිහාසයේ දුර්මතවලින් මිදුණු බව
3. මිනිස් සමාජයෙන් දුරස් වූ බව
4. තුවක්කුව තමන්ට අනවශ්‍ය බව
5. වයස්ගත බැවින් දඩයම නුසුදුසු බව

32. “ රජ - මේ හෙවනට වෙලා බලාගෙන ඉන්න ඕනේ ටිකක් ( එසේ බලා සිටී)” මේ අයුරින් කරනු ලබන රඟපෑම භරත විසින් හඳුන්වනු ලබන්නේ,

1. මුද්‍රා පෑම ලෙස
2. ජනාන්තික භාෂණය ලෙස
3. අංකුරාභිනය ලෙස
4. චූලිකා අවස්ථාවක් ලෙස
5. පරික්‍රමණය ලෙස

33. අභිඥාන ශාකුන්තලය නාට්‍යයේ හයවන අංකය ආරම්භ වන්නේ,

1. විශ්කම්භයකිනි
2. චූලිකාවකිනි
3. ප්‍රවේශකයකිනි
4. අංකාවතාරයකිනි
5. අංකමුඛයකිනි

34. නාට්‍ය කලාව ලලිත කලාවක් වශයෙන් හැඳින්වීමට ප්‍රධාන හේතුව සඳහන් ප්‍රකාශය තෝරන්න.

1. සජීවීව ප්‍රේක්ෂක සබඳතාව මුල්කරගනිමින් ගොඩනැගීම
2. ග්‍රාම්‍ය ජන සමාජය ද කේන්ද්‍ර කර ගනිමින් විකාශය වූ අභිචාර කලාවක් මූලාශ්‍ර කරගනිමින් ප්‍රෙක්ෂාව මූලිකව ගොඩනැගීම
3. රසිකයාගේ ඥානය පුළුල් කරමින්, වඩා ආධ්‍යාත්මික ශික්ෂණය ඇති කිරීමට උත්සාහ දැරීම
4. යම් පමණකට මිනිස් චෛතන්‍යය සමඟ ආත්මීය බැඳීමක් ඇතිකරවීමට සමත් වුවද මිනිස් සිතේ භාවමය පක්ෂය සමඟ පමණක් සම්බන්ධ වීම
5. සාහිත්‍යය මූලික කරගත් කලාවක් වශයෙන් ගොඩනැගෙන අන්තර්ගතයකින් යුතුව බිහිවී තිබීම

35. කෝලම් ජනනාටකවල කාරියකරවන රාළ විසින් විස්තර කරනු ලබන මෙම චරිතය වන්නේ,
සිරුර නැත බලයක් - දෙපය අඩුවිය සවියක්
වෙව්ලමින් උවනත් - උරෙහි එල්ලා බෙරයත්

1. පොලිස්
2. ආරච්චි
3. හේවා
4. අණබෙර
5. ලෙංචිනා

36. ''මට ඕන නෑ යකාගේ නපුරුකම් දැනගන්න, මම නොදැන නෙමෙයි ආවේ, මම අද මෙතන නවතින්නමයි අධිෂ්ඨාන කරගත්තේ'' මෙම සංවාද කොටස ඇතුළත් බෞද්ධ පූජාකර්මය කුමක් ද?

1. මිලින්ද ප්‍රශ්නය
2. යුගාසන බණ
3. ආලවක දමනය
4. අඹ විදමන
5. සූවිසි විවරණය

37. කොහොඹා කංකාරිය පවත්වනු ලබන ස්ථානය තෙක් යක් දෙස්සා පැමිණි ගමන් මඟ ඉදිරිපත් කිරීම පිළිබඳ තොරතුරු අයත් වන්නේ,

1. ඌරා යක්කම
2. නයා යක්කම
3. දර්ශන යක්කම
4. සීතා
5. වැදි

38. නාඩගම්හි පූර්ව රංගයේ දී දැකියහැකි පාත්‍රයන් ඇතුළත් පිළිතුර වන්නේ,

1. පොතේ ගුරු හා ආඩි ගුරු
2. හඬ දූතයා සහ පරයා
3. කාරියකරවන රාළ සහ දේශනවාදීන්
4. පච්චමීරා සහ කාලි
5. බහුභූතයා සහ දේශණවාදීන්

39. උත්තර ශෛලිය ඇතුළත් ද්‍රවිඩ ජනනාටක වර්ගය,

1. වඩමෝඩි
2. තෙන්මෝඩි
3. මකිඩි
4. වසන්තනකූත්තු
5. කාමන්කූත්තු

40. ශ්‍රී ලංකාවේ ද්‍රවිඩ නාට්‍ය පිළිබඳ ශාස්ත්‍රීය පර්යේෂණ කළ දෙස් විදෙස්හි ප්‍රකට මහාචාර්යවරයෙකි,

1. එම්. ශන්මුගලිංගම්
2. කේ. කනපතිපිල්ලේ
3. කුලන්ගෙයි ශන්මුගලිංගම්
4. කාර්තිගේසු සිවතම්බි
5. චොර්ණලිංගම්

## පෙරදිග පත්‍රය

## II කොටස

### A කොටස

1. 1. කුවේණිය යනු යකිනියක නොව සදාකාලික ගැහැනිය බව ප්‍රේක්ෂකයාට තහවුරු කරන්නට නාට්‍යකරුවා උපයෝගී කරගන්නා චරිත දෙකක් නම් කරන්න.
   2. එම චරිත දෙකෙහි නිරූපණ ක්‍රියාවලිය මගින් එය තහවුරු වන ආකාරය විමසන්න.
   3. නාට්‍යකරුවාගේ උත්සාහය කෙතරම් දුරට සාර්ථක වී ඇති දැයි තුන්වන අංකය ඇසුරෙන් පැහැදිලි කරන්න.

2. 1. අභිඥානශාකුන්තලය නාට්‍යයේ එන ප්‍රධාන චරිත පෙළගස්වන්න.
   2. සකුන්තලාට ස්වාමියා දැකීමට කෙතරම් අවශ්‍ය වුවත් අසපුව දමා යන විට ඇගේ පා අකර්මණ්‍ය වේ උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.
   3. කාලිදාසයන් විසින් දුශ්‍යන්ත රජු නිරූපණය කොට ඇත්තේ ආදර්ශවත් මිනිසකු, ආදර්ශවත් සැමියකු හා ආදර්ශමත් රජකු ලෙසිනි ඔබේ අදහස් ලියන්න.

3. 1 සංස්කෘත නාට්‍යයෙහි නෙතෘ යනු කවුරුන්ද?
   2. නෙතෘගේ රංග කාර්යය අවස්ථා පහකට ගොඩනැගෙයි කෙටියෙන් පැහැදිලි කරන්න.
   3. ඔබ තෝරාගත් සංස්කෘත නාට්‍යයක් ඇසුරින් එම අවස්ථා නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

### B කොටස

4. 1. නාඩගම් නාට්‍ය කලාව මෙරට ව්‍යාප්තව තිබූ කාලයේ එම නාට්‍ය සම්ප්‍රදාය අභිබවා පැනනැගුණු නව නාට්‍ය ප්‍රවණතා තුනක් සඳහන් කරන්න.
   2. ඉන් එක් නාට්‍ය ප්‍රවණතාවයක ඔබ හඳුනාගෙන ඇති සුවිශේෂී ලක්ෂණ පිළිබඳ විමසීමක් කරන්න.
   3. පැරණි නාඩගම් නාට්‍ය සම්ප්‍රදාය නූතන නාට්‍ය නිර්මාණ සඳහා භාවිත කර ඇති ආකාරය පිළිබඳ විමසුමක් කරන්න.

5. 1. ‘කබුකි’ හෝ ‘නෝ’ නාට්‍ය සම්ප්‍රදායන්වල භාවිත වන රංග භූමිය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
   2. කබුකි නාට්‍ය කලාවේ ප්‍රභවය සහ විකාශනය සිදු වූ ආකාරය පැහැදිලි කරන්න.
   3. නෝ සහ කබුකි නාට්‍ය කලාවල රංග ශෛලීන් අතර පවතින වෙනස්කම් තුනක් විස්තර කරන්න.

6. 1. ප්‍රාසංගික කලාවේ මූලික නිර්ණායක හඳුන්වන්න.
   2. සෙසු කලා හා ප්‍රාසංගික කලා අතර වෙනස පැහැදිලි කරන්න.
   3. ප්‍රාසංගික කලා අතර නාට්‍ය කලාවට හිමිවන තැන පැහැදිලි කරන්න.

අ.පො.ස. උසස් පෙළ

# නාට්‍ය හා රංගකලාව II

Channel NIE

**අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා වූ පෙරහුරු පරීක්ෂණය**

නාට්‍ය හා රංගකලාව - I1 අපරදිග — කාලය: පැය තුනයි

උපදෙස්:

විභාග අංකය :....................................

❖ **I කොටස** - **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
❖ **II කොටස** - **A** හා **B** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

(01) මධ්‍යකාලීන නාට්‍යවලට භාවිත කළ වේදිකාවක් සඳහන් වරණය තෝරන්න.
(1) ප්‍රක්ෂිප්ත වේදිකා
(2) Proscenium වේදිකාව
(3) වට රවුම් වේදිකාව
(4) කැරකෙන වේදිකාව
(5) ජංගම රථ වේදිකාව (................)

(02) "සොයන්නහු ද කවුරුන් මේ සොහොනෙහි කිතුනුවනි
සොයන්නෙමු අපි මෙහි ඇණ ගසන ලද කුරුසේ ජේසු සමිඳාණන්......"
ඉහත සඳහන් සංවාද කොටස මධ්‍යකාලීන නාට්‍ය කලාව හා සම්බන්ධ වන්නේ කෙසේ ද?
(1) සකලජන නාට්‍යයේ ආරම්භක සංවාද කොටසයි
(2) පල්ලිය තුළ රඟ දැක්වූ මුල්ම නාට්‍යයට අයත් සංවාද කොටසයි
(3) ආදම් සහ ඒව පිළිබඳ කතා පුවතට අයත් සංවාද කොටසයි
(4 යෝක් චක්‍රයට අයත් නාට්‍යයක හමුවන පළමු වන සංවාද කොටසයි
(5) ජේසු උපත බැහැ දැකීමට ආ රජතුන් කට්ටුව අදාළ සංවාද කොටසයි (................)

03) පරිකල්පනය යන්නට වඩාත් සුදුසු අර්ථකථනය කුමක් ද?
(1 ) යථාර්ථය මනාව වේදිකාවක් මත නිර්මාණය කිරීම
(2) නිර්මාණශීලීත්වයෙන් යමක් දෙස බැලීම
(3) යථාර්ථයෙන් ඔබ්බට නිර්මාණාත්මකව සිතීම
(4 පවතින සිද්ධියක් ඒ ආකාරයෙන්ම ප්‍රතිනිර්මාණය කිරීම
(5) ගැඹුරෙන් සිතා යමක් නිර්මාණය කිරීම (................)

4) සංගීත ප්‍රසංගයක්, නර්තන ප්‍රසංගයක්, වේදිකා නාට්‍යයක් පටිගත කළ විට ප්‍රාසංගික කලා ලෙස නම් කළ නොහැකි ය. එයට හේතු වන වඩාත් නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) කැමරාවක සටහන් වීමේ දී ප්‍රාසංගික ගුණය විනාශ වෙයි
(2) නැවත නැවත නැරඹීමේ දී කලා කෘතියෙහි කුතුහලය ගිලිහී යයි
(3) සජීවි බව නොමැති වීම නිසා සෘජු ප්‍රේක්ෂක සහසම්බන්ධතාව ගිලිහී යයි.
(4) නිර්මාණය රස වින්දනයෙහි ලා බාධා පැමිණේ
(5) අර්ථවත් බව ගිලිහී යයි. (................)

(5) ඊඩිපස් නාට්‍ය පෙළෙහි පහත දැක්වෙන චරිත හමු වන අනුපිළිවෙළ වන්නේ,
(1) ඊඩිපස්, පූජකයා, කොරින්ත් දූතයා, ක්‍රෙයෝන්, යොකොස්ටා, තයිරේසියස්
(2) යොකොස්ටා, ඊඩිපස්, පූජකයා,ක්‍රෙයෝන්, තයිරේසියස්, කොරින්ත් දූතයා
(3) පූජකයා, ඊඩිපස්, ක්‍රෙයෝන්, තයිරේසියස්,යොකොස්ටා, කොරින්ත් දූතයා
(4) ඊඩිපස්, පූජකයා,ක්‍රෙයෝන්,තයිරේසියස්, කොරින්ත් දූතයා,යොකොස්ටා
(5) පූජකයා, ඊඩිපස්, ක්‍රෙයෝන්, තයිරේසියස්, කොරින්ත් දූතයා, යොකොස්ටා (................)

(6) පහත සඳහන් වන්නේ ග්‍රීක නාට්‍ය පිළිබඳ ප්‍රකාශ කිහිපයකි.
A. කතා වස්තුව සරල සහ සංකීර්ණ වශයෙන් කොටස් දෙකකි.
B. හාස්‍යජනක ග්‍රීක පුරාණෝක්ති කතා වස්තු ලෙස තෝරා ගෙන ඇත.
C. 24 දෙනෙකුගෙන් සමන්විත ගායන වෘන්දයක් භාවිත විය.
D. බොහෝවිට ගායන වෘන්දයේ පිරිසගේ නමින් නාට්‍ය හැඳින්විණ.
E. භය සහ කාරුණ්‍ය මූලික කර ගෙන භාව විශෝධනය සිදුවේ.
F. ගැටලුකාරී තත්වයකින් ඇරඹෙන නමුත් ප්‍රීතිමත් අවසානයක් සහිත වේ.
G. කතා නායකයා භාග්‍යයෙන් අභාග්‍යයට යාම ප්‍රමාද දෝෂයකින් සිදු වේ.

ඉහත සඳහන් ලක්ෂණ අතුරෙන් ට්‍රැජඩි නාට්‍ය වර්ගයෙහි අන්තර්ගත ලක්ෂණ පමණක් ඇතුළත් වරණය කුමක් ද?
(1) A,C,G
(2) D,E,G
(3) C,D,G
(4) B,D,E
(5) A,E,G (................)

(7) "ප්‍රේක්ෂාව මගින් භය සහ කාරුණ්‍ය මතු කර ගත හැකි ය. එහෙත් ඒ භාවයන් නාට්‍යයේ ව්‍යූහය හා සිද්ධි මගින් ද මතුකර ගත හැකි ය.'' මෙම ප්‍රකාශය සිදු කරන ලද්දේ කවරකු විසින් ද?
(1) ඇරිස්ටෝටල්
(2) ඇලෙක්සැන්ඩර් ඩූමා
(3) බර්නාඩ් ෂෝ
(4) ශේක්ෂ්පියර්
(5) තෝල්ස්තෝයි (................)

(8) පහත දැක්වෙන නාට්‍ය අතුරෙන් ශෝකජනක නාට්‍යයක් වන්නේ
(1) The tempest හෙවත් කුණාටුව
(2) King Lear හෙවත් ලියර් රජ
(3) Midsummer night's dream හෙවත් ගිම්හානයේ මැදියම් රැයක සිහිනයක්
(4) Merchant of Venice හෙවත් වැනිසියේ වෙළෙන්දා
(5) Comedy of errors හෙවත් වැරදීමේ ප්‍රහසනය (................)

(9) ජුලියස් සීසර් නාට්‍යයට පාදක මූලාශ්‍රය වන්නේ
(1) ප්ලූටාක්ගේ 'ග්‍රීක රෝම වංශවතුන්ගේ ජීවිත' නම් කෘතියයි.
(2) එංගලන්තයේ, අයර්ලන්තයේ සහ ස්කොට්ලන්තයේ වංශකතායි.
(3) වර්ජිල්ගේ ඊනිඩ් කෘතියයි.
(4) හෝමර්ගේ ඔඩිසි කාව්‍යයයි
(5) ප්ලේටෝගේ සිම්පෝසියම් සංවාදයයි. (................)

(10) හෙන්රික් ඉබ්සන් රචනා කළ නාට්‍ය පමණක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) මිස් යුලී, කතුවරයෙක් සොයන චරිත හයක්, සමාජයේ කුලුණු
(2) ගොඩෝ එනකං, හිරු දහසක්, අවතාර
(3) වන තාරාවා, තරුණ සංගමය, ජන හතුරා
(4) රොස්මශෝම්, ආර්මිස් ඇන්ඩ් ද මැන්, චෙරි වත්ත
(5) අප මළවුන්ගෙන් නැගිටි කල්හි, මකරා, ගැලීලියෝ (................)

(11) පහත සඳහන් නාට්‍යකරුවන් අතුරෙන් ප්‍රකට ප්‍රකාශනවාදී නාට්‍යකරුවා තෝරන්න.

(1) අර්වින් පිස්කැටර්
(2) ඕගස්ට් ස්ට්‍රින්බර්ග්
(3) ඉයුජින් අයෙනෙස්කෝ
(4) ඇලෙක්සැන්ඩර් ඩූමා
(5) ආතර් ඇඩමොෆ් (................)

(12) නාට්‍යය විචාරයට අදාළ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) නාට්‍ය විචාරය පිළිබඳ පැරණිම ග්‍රන්ථය රචනා වූයේ ශෝකජනක නාට්‍යයට අදාළව ය.
(2) නාට්‍ය විචාරය පිළිබඳ පිළිගත් සිද්ධාන්ත කිසිවක් නැත.
(3) නාට්‍ය හෝ ප්‍රේක්ෂක නාට්‍ය විචාරකයා හොඳ රසිකයෙක් හා ප්‍රේක්ෂකයෙක් විය නොහැක.
(4) නාට්‍ය විචාරය අපරදිගට පමණක් සීමා වූ මතවාදයකි.
(5) නාට්‍ය කලාවේ අභිවෘද්ධිය සඳහා විචාර කලාවක් අත්‍යවශ්‍ය ය. (................)

(13) ආඛ්‍යාන රංග රීතිය යනුවෙන් හඳුන්වනුයේ

(1) අසම්මත රංග රීතිය
(2) යථාර්ථවාදී රංග රීතිය
(3) ස්වභාවික රංග රීතිය
(4) romantic රංග රීතිය
(5) දූරස්තීකරණ රංග රීතිය (................)

(14) "නව රූපණ විධික්‍රමය" බිහි කරන ලද්දේ

(1) මේයර්හෝල්ඩ්
(2) දේනි දිදරෝ
(3) බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්
(4) ස්ටැනිස්ලව්ස්කි
(5) චෙකොව්ස්කි (................)

(15) නිදහස් පද්‍යය (Blank verse) භාවිත කරමින් නාට්‍ය රචනයේ යෙදුණේ

(1) ශේක්ස්පියර් ය.
(2) යුරිපිඩීස් ය.
(3) හෙන්රික් ඉබ්සන් ය.
(4) බර්නාඩ් ෂෝ ය.
(5) ඇන්ටන් චෙකොෆ් ය. (................)

(16) ටොම් මාමාගේ කුටිය නාට්‍යය

(1) අති නාට්‍යයකි
(2) රොමැන්ටික් නාට්‍යයකි
(3) යථාර්ථවාදී නාට්‍යකි
(4) වීර ආඛ්‍යාන නාට්‍යකි
(5) ප්‍රකාශනවාදී නාට්‍යකි (................)

(17) සංකේත මගින් පමණක් ජනිත කළ හැකි යථාර්ථයක් පිළිබඳව ප්‍රකාශවන නාට්‍ය ක්‍රමයෙහි සුප්‍රකට නාට්‍යකරු

(1) හෙන්රික් ඉබ්සන් ය
(2) මොරිස් මීටර්ලින්ක් ය
(3) මැක්ස් රයින් හාට් ය
(4) ඉවාන් තුර්ගනිව් ය
(5) ඇලෙක්සැන්ඩර් ඩූමා ය (................)

(18) 1599 දී ඉදිකළ ග්ලෝබ් රඟහලේදී ප්‍රථම වතාවට රඟ දැක්වූ බව සඳහන් වන නාට්‍යය, ඇතුළත් වරණය තෝරන්න.

(1) රෝමියෝ ජුලියට්
(2) මැක්බත්
(3) ඔතෙලෝ
(4) ජුලියස් සීසර්
(5) හැම්ලට් (................)

ප්‍රශ්න අංක 19-23 පිළිතුරු සැපයීමට පහත සඳහන් වචන ගොනුව භාවිත කරන්න. අදාළ පිළිතුරු හිස්තැන් මත ලියන්න.

| | | |
|---|---|---|
| A. නිරයේ මුඛ ද්වාරය | F. වළාකුළු | K. හියු බ්‍රිස් |
| B. බූත් වේදිකාව | G. ස්පැනිෂ් ට්‍රැජඩි | L. ශීලර් |
| C. පෙයිසිස්ට්‍රාටස් | H. ද මිත් ඔෆ් සිසිපස් | M. රොබර්ට් ග්‍රීන් |
| D. වේටින් ෆෝ ගොඩෝ | I. වින්ටර්ස් ටේල් | N. ආතර් ඇඩමොව් |
| E. දොන් කාලොස් | J. ෆවුස්ට් | O. මැන්කයින්ඩ් |

(19) මධ්‍යකාලීන යුගයේ නාට්‍ය කලාව හා සබැඳි තොරතුරු ඇතුළත් අක්ෂර වනුයේ ……......,....... ය.

(20) තෙස්පීස්ගෙන් ආරම්භ වූ ලෝකයේ ඉපැරණි ම නාට්‍ය සම්ප්‍රදායට අයත් වදන් තුනට අදාළ අක්ෂර සටහන් කරන්න .......,........

(21) දෙවන ලෝක යුද්ධයෙන් පසු ඇති වූ නාට්‍ය ප්‍රවණතාවක් හා බැඳි අක්ෂර මේවා ය ......,........

(22) රොමැන්ටික් වාදය හා සබැඳේ ......,........

(23) පුනරුදයේ මිනිසා බිහි වූ යුගයට අදාළ නාට්‍ය කලාව හා සම්බන්ධිත අක්ෂර වන්නේ ,.......,........

(24) නාට්‍යක ගැටුමක දක්නට ලැබෙන මූලික ලක්ෂණය වන්නේ.

(1) සමාරෝපය
(2) සංවාද භාවිතය
(3) ආතතිය
(4) අනුරූපණය
(5) සංගීතය (................)

(25) සරල හෙවත් ඍජු අංග රචනයක අරමුණක් නොවේ.

(1) වේදිකා ආලෝකකරණයට උචිත ලෙස අංග රචනය කිරීම
(2) මුහුණේ උපාංග මතු කර දැක්වීම
(3) චරිතයේ අභ්‍යන්තර ගති ගුණ මතුකර දැක්වීමෙන් බාහිර ස්වභාවය වෙනස් කිරීම
(4) බාහිර ස්වරූපය පවතින ආකාරයෙන් ම මතු කර දැක්වීම (................)

(26) වේදිකා පසුතල ද්‍රව්‍යමය වශයෙන් සකස් කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණුවලින් අදාළ නොවන්නේ.

(1) වර්ණමය ගැළපීම
(2) උචිත බව හා විශ්වසනීය බව
(3) පහසුවෙන් හැසිරවිය හැකි වීම
(4) ආලෝකය එල්ල වන කෝණය හා තීව්‍රතාව අනුව සැකසීම
(5) සැහැල්ලු බව (................)

(27) ප්‍රාසංගික කලා පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A. ප්‍රේක්ෂක සහභාගිත්වය අනිවාර්ය වේ.
B. සතර අභිනය භාවිත වේ.
C. නිශ්චිත ස්ථානයක ඉදිරිපත් කරනු ලැබේ.
D. මුල මැද අග ගැළපෙන කතාවකින් සමන්විත වේ.
E. අපූර්වත්වයෙන් යුක්ත වේ. (................)

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශ පමණක් දැක්වෙන වරණය තෝරන්න.

(1) B,C,D
(2) B,D,E
(3) A,C,D
(4) A,B,C
(5) A,CE

(28) නාට්‍යමය අවස්ථාවක් නිර්මාණය කිරීමේ දී සැලකිලිමත් විය යුතු පහත කරුණු අතුරෙන් ප්‍රධාන වන්නේ,

(1) චරිත හා සිදුවීම් අතර පරස්පරතාවයන් මතු කිරීම ය.
(2) නාට්‍යමය අවස්ථාවේ පරිසරය, දේශය, සමාජ ස්වභාවය පිළිබඳ අවධානය යොමු කිරීම ය.
(3) නාට්‍යාවස්ථාවෙහි හමුවන රිද්මය අධ්‍යනය කිරීම ය.
(4) නාට්‍ය ශෛලිය පිළිබඳ අවධානයෙන් අවස්ථාව ගොඩ නැගීම ය.
(5) මොහොතින් මොහොත වෙනස් වන ප්‍රේක්ෂාව ගොඩ නැගීම ය. (................)

(29) "ඇහැට ඇහැ පේන්නේ නැහැනේ. ඒකේ ප්‍රතිබිම්බය පේනවා මිසක. ඒ වගේ මටත් මගේ මූණ පේන්නේ නැහැ" යි ප්‍රකාශ කරනු ලබන්නේ.

(1) බ්‍රූටස් විසින් කැසියස්ට ය.
(2) සීසර් විසින් මාක් ඇන්ටනිට ය.
(3) කැසියස් විසින් ලිගේරියස්ට ය.
(4) මාක් ඇන්ටනි විසින් ඔක්ටේවියස්ට ය.
(5) කස්කා විසින් පොම්පේට ය. (................)

(30) ක්‍රොග්ස්ටඩ් විසින් ලියුම් පෙට්ටියට දැමූ පොරොන්දු පත්‍රය ආපසු ගැනීමට සැරසෙද් දී ලින්ඩේ මහත්මිය ඔහුට ප්‍රකාශ කරන්නේ,

(1) එයට කලින් හෙල්මෙ හමු වී සත්‍ය ප්‍රකාශ කරන ලෙස ය.
(2) වහාම එය රැගෙන නෝරාගේ අතට ම දෙන ලෙස ය.
(3) ඇය හෙල්ම සමඟ සියල්ල ප්‍රකාශ කරන තුරු නිහඬව සිටින ලෙස ය.
(4) එයින් හෙල්ම දැනුවත් වී ඔහු හා නෝරා පිළිබඳ අවබෝධයක් ඇති කර ගන්නට ඉඩ දෙන ලෙස ය.
(5) හෙල්ම පහළට ආ විට නෝරාට හොරෙන් එය ආපසු ඉල්ලා ගන්නා ලෙස ය. (................)

(31) "අනුන් නිසා තමුන්ගේ ජීවිතේ බාගයක් ම නැති කරගත්ත කෙනෙක් මං. මේ ඉතුරු බාගෙ මං දෙවියන් වහන්සේ නිසාවත් නැති කරගන්නේ නෑ…." මෙම ප්‍රකාශය කරන ලද්දේ,

(1) නෝරා විසින් හෙල්මට
(2) ලින්ඩා මහත්මිය විසින් ක්‍රොග්ස්ටඩ්ට
(3) දොස්තර රන්ක් විසින් නෝරාට
(4) නෝරා විසින් ලින්ඩා මහත්මියට
(5) ක්‍රොග්ස්ටඩ් විසින් හෙල්මට (................)

(32) බ්‍රූටස් ජනතාව ඇමතීම, පෝර්ෂියා ගල් අඟුරු කා සියදිවි හානිකර ගැනීම, සීසර් ගේ අවතාරය බ්‍රූටස්ට දර්ශනය වීම සිදුවීම් පිළිවෙළින් ඇතුළත් අංක වනුයේ.

(1) 2 සහ 3
(2) 1 සහ 5
(3) 4 සහ 5
(4) 3 සහ 4
(5) 2 සහ 4 (................)

(33) සීසර් ඝාතකයින් පරාජය කිරීමෙන් පසු උපක්‍රමශීලී ව ත්‍රිපුද්ගල පාලන අධිකාරියෙන් අයින් කරමු යැයි මාක් ඇන්ටනි විසින් යෝජනා කරන්නේ

(1) පොම්පේ
(2) බ්‍රූටස්
(3) ලිගේරියස්
(4) මෙටලස්
(5) ලෙපිඩස් (................)

- පහත දැක්වෙනුයේ ග්‍රීක නාට්‍ය කලාවට අදාළ වදන් ගොනුවකි.
  පහත වදන් ගොනුව ඇසුරෙන් 34 සිට 38 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A. ඩිතුරම්බොස්
B. ෆ්රෑනිකස්
C. ප්‍රොමිතියස් බන්ධනය
D. දෙබරු
E. පැරඩෝස්
F. මණ්ඩූකයෝ
G. පැරස්කිනියා
H. සප්ලයන්ට්ස්
I. ඒරියන්
J. බොයිරිලොස්
K. තයිමිලි
L. වලාකුළු
M. පර්සියන්ස්
N. ප්‍රටිනස්
O. සෝලෝ

(34) ග්‍රීක රංග භූමියට අදාළ අක්ෂර වනුයේ (................)

(35) තෙස්පීස්ගෙන් පසුව සහ ඊස්කිලස් ට පෙර සිටි ග්‍රීක නාට්‍ය කරුවෝ (................)

(36) ඊස්කිලස් විසින් රචිත ට්‍රැජඩි නාට්‍ය වේ. (................)

(37) ඇරිස්ටොෆනීස්ගේ පැරණි කොමඩි නාට්‍ය මේවාය. (................)

(38) ග්‍රීක නාට්‍ය ප්‍රභවය හා සම්බන්ධ නාමයන් වේ. (................)

(39) නාට්‍ය හා රංග කලාව යන දෙපදයෙන් රංග කලාව යන්නට අයත් ත්‍රිවිධ කාර්යයන් වනුයේ,

(1) රචනය, රඟපෑම සහ නිෂ්පාදනය
(2) රචනය, නිෂ්පාදනය සහ විචාරය
(3) සැලසුම්කරණය, සංවිධානය සහ ප්‍රදර්ශනය
(4) රූපණය, ආනුශංගික නිර්මාණය සහ විචාරය
(5) රංග වින්‍යාසය, තාක්ෂණික ප්‍රයෝග භාවිතය සහ අධ්‍යක්ෂණය (................)

(40) ඊඩිපස් නාට්‍යයේ දී ප්‍රේක්ෂකයාට දර්ශනය නොවන්නකි,

(1) අන්ධ තෙරේසියස් තීබ මාලිගාවට පැමිණීම
(2) කොරින්ත වැසියා පොලිබස්ගේ මරණය ගැන ප්‍රකාශ කිරීම
(3) රුධිරය වෑහෙන දෙනෙතින් ඊඩිපස් මාළිගයේ ඉදිරියට පැමිණීම
(4) ජොකොස්ටා බිසව සියදිවි හානිකර ගැනීම
(5) ගොපල්ලා ඊඩිපස්ගේ දෙපාවල විකෘති බව දැකීම (................)